218

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කලමනාකරණ සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරික්ෂණය 2009

ව්‍යවසායකත්වය : MCC 1201

කාලය – පැය දෙකයි (02)

දිනය : 2009.12.05 | වේලාව : පෙ.ව. 10.00 – මධ්‍යහ්න 12.00

ප්‍රශ්න හතර (04) කට පිළිතුරු සපයන්න. සියලු ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

1. සියළු ව්‍යාපාරිකයෝ උපතින්ම ව්‍යවසායකයෝ නොවෙති. ඉහත ප්‍රකාශය සමග ඔබ එකග වන්නේද? ඔබගේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

2. රජයේ සේවයෙන් විශ්‍රාම යෑම හේතු කොට ගෙන ඔබේ පියාට රු. 150,000/- මුදලක් ලැබුනේ යයි සිතන්න. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කලමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හදාරා සම්පූර්ණ කල ඔබගෙන්, සුදුසු ව්‍යාපාරයක උක්ත මුදල ආයෝජනය කිරීමට ඇති අවස්ථා සම්බන්ධයෙන් ඔබේ පියා උපදෙස් පතයි. ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා ඔබ පියාට දෙන උපදෙස් හා උපක්‍රම පිළිබඳ විස්තරයක් ලියන්න.

3. ලංකාවේ අරඹන කුඩා ව්‍යාපාර වලින් සැහෙන ප්‍රමාණයක් මුල් අවස්ථාවේ සිටම අසාර්ථක බවක් පෙනේ. අසාර්ථකත්වයට දායක වන ප්‍රධාන සාධක 4 ක් දක්වන්න. එම සාධක සත්‍යාපනය කිරීමට අසාර්ථක ව්‍යවසායකයින් 25 දෙනෙකුගෙන් ඔබ විමසන ප්‍රශ්න 10 ක් ලැයිස්තු ගත කරන්න.

4. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කලමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව මෑතකදී සාර්ථක ලෙස නිම කල ඔබට, ඔබ ප්‍රදේශයේ ස.ණ.ස ශාඛා බැංකුවෙන් කුඩා ව්‍යාපාර ගැන දේශනයක් සඳහා ආරාධනාවක් ලැබී තිබේ. ඔබ විසින් කල යුත්තේ ස.ණ.ස බැංකු සාමාජිකයින් ඔබ ප්‍රදේශයේ කුඩා ව්‍යාපාර ඇරඹීම සඳහා විනාඩි 20 ක දේශනයක් පැවැත්වීමයි. ඔබ දේශනයේ වැදගත් කරුණු අලලා සටහනක් පිළියෙල කරන්න.

5. කෙටි සටහන් ලියන්න.
   - i ව්‍යවසායකත්වය නිර්වචනය කර එය කෙටියෙන් පහදන්න.
   - ii අවදානම භාර ගැනීම පිළිබඳ ලක්ෂණ මොනවාද?
   - iii එකම ව්‍යාපාර කටයුත්තක යෙදෙන විශාල ව්‍යාපාර අසල කුඩා ව්‍යාපාර සාර්ථකව ඉදිරියට යයි. මෙබඳු තත්ත්වයන් පැවතීමට ඇති රහස කුමක් දැයි උදාහරණ සහිතව පහදන්න.

LIBRARY

- හිමිකම් ඇවිරිණි -